උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 11 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 අප්‍රේල් 12 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ). මූල්‍ය ප්‍රකාශන සමඟ දක්වා තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුව මුද්දර ගාස්තු උපචිත පදනම මත ගිණුම් ගත කරන බව දක්වා ඇතත්, සමාලෝචිත වර්ෂය තුල මුද්දර ගාස්තු ලෙස ලැබී තිබූ රු.5,947,496 ක ප්‍රමාණයක් මුදල් පදනම මත ගිණුම් ගතකර තිබුණි.

(ආ). බැකෝ යන්ත්‍රය වෙනුවෙන් දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය මුදල සඳහා 2010 අවසාන කාර්තුව වෙනුවෙන් ගෙවිය යුතු ණය වාරිකය හා පොලිය වූ රු.305,783 ක මුදල 2010 දෙසැම්බර් 30 දින ගෙවා තිබුණද විවිධ ණය හිමියන් යටතේ අදාල පොලී මුදල වන රු.49,918 ක මුදලක් දක්වා තිබීමෙන් විවිධ ණය හිමි ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඇ). 2010 තුන්වන කාර්තුව වෙනුවෙන් ගෙවිය යුතු රු.21,019 ක් හා හතර වන කාර්තුවට අදාල රු.21,905 ක් වූ මුද්දර බදු මුදල් ණය හිමියන් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ). ගමනැගුම ව්‍යාපෘතියේ කර්මාන්ත 15 කට අදාලව ණයහිමි හා ණයගැති ගිණුම් රු.2,760,469 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 10 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.27,764,267 ක් වූ අතර, උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.8,119,146 ක් විය.

1.3.3 පැහැදිලි නොකළ වෙනස්කම්

සේවක ණය ගිණුමේ පැහැදිලි නොකල රු. 772,636 ක ශේෂයක් පැවතුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.10,305,597ක් වූ අතර, එයින් කාල විශ්ලේෂණ ඉදිරිපත් කර තිබූ රු.2,252,119 කට අදාලව වර්ෂ අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.1,181,398 ක් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.18,458,302 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.2,002,073 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.3,048,097 ක් විය.

2.2 මූල්‍ය පාලනය

සභාවේ පොදු බැංකු ගිණුමෙහි (028-100113254901) 2010 දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුම අනුව නිකුත් කල නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ මාස 6ට වඩා වැඩි වටිනාකම රු.1,550,025 ක චෙක්පත් 101 ක් පැවති අතර එය තුල 2008 වර්ෂයේ සිට පැවත එන සේවක අර්ථසාධක අරමුදලට ලියන ලද රු.261,796 ක් වටිනා චෙක්පත් 10 ක්ද සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට ලියන ලද රු.34,215 ක් වටිනා චෙක්පත් 8 ක්ද විශ්‍රාම වැටුප් අරමුදලට ලියන ලද රු.443,677 ක් වටිනා චෙක්පත් 21 ක් ද පැවතුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 768 | 680 | 426 | 766 | 725 | 305 |
| (ii) | බදුකුලී | 1,891 | 18,377 | 1,770 | 1,465 | 1,442 | 1,431 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 692 | 678 | 201 | 63 | 17 | 442 |
| (iv) | වෙනත් ආදායම් | 32,477 | 30,280 | 2,668 | 32,715 | 30,671 | 7,315 |
| | එකතුව | 35,828 | 50,015 | 5,065 | 35,009 | 32,855 | 9,493 |

2.3.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර ඇති රු.2,667,685 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.3.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු හිඟ මුද්දර ගාස්තු කිසිවක් නොමැති බව ගිණුම්වල දක්වා තිබුණද 2010 මාර්තු - දෙසැම්බර් දක්වා ලැබී තිබූ මුද්දර ගාස්තු, ලේඛණ වල දක්වා නොතිබුණි.

2.3.4 හිඟ ආදායම්

සභාවේ වරිපනම් ලේඛණ අනුව සභා බල ප්‍රදේශය තුල වරිපනම් බදුකරුවන් 1108 ක් සිටි අතර ඔවුන්ගෙන් දේපල 533 කට අදාල සමාලෝචිත වර්ෂය අවසානයට හිඟය රු.306,843 ක් විය. විගණනයේදී කල නියැදි පරීක්ෂාවට අනුව අවස්ථා 17 ක රු.1,000 කට වැඩි හිඟ මුදලක් පැවති ස්ථානවල හිඟ බදු එකතුව රු.38,970 ක් වූ අතර මෙකී හිඟ කාලය කාර්තු 6 - 16 ත් අතර විහිදී පැවතුණි. හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 33 - 41 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.3.5 අක්කර බදු

අක්කර බදු ලේඛණ අනුව සභා බල ප්‍රදේශය තුල අක්කර බදු ගෙවන්නන් 368 ක් සිටි අතර ඔවුන්ගෙන් 281 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට රු.110,832 ක හිඟයක් විය. විගණනයේදී කල නියැදි පරීක්ෂාවට අනුව රු.500 කට වැඩි හිඟ මුදලක් පැවති ස්ථානවල හිඟ බදු එකතුව රු.39,197 ක් වූ අතර මෙකී හිඟ කාලය කාර්තු 14 - 49 ත් අතර විහිදී පැවතුණි. හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 45 රීතියේ දක්වා ඇති පරිදි රීති මාලා අංක 33 - 41 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.3.6 වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු

වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු අයකිරීම සම්බන්ධව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150(1) හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 59 රීතිය ප්‍රකාරව ක්ෂේත්‍ර පරීක්ෂාවක් කර වෙළඳ හා ව්‍යාපාර බලපත්‍ර ලබාගත යුතු ස්ථාන හඳුනා ගැනීමක් සිදුකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාලව එවැනි පරීක්ෂාවක් සිදුකර නොතිබූ අතර ආයතනයට මුදල් බැඳීම හා ක්ෂේත්‍රයේදී මුදල් එකතු කිරීම පමණක් සිදුකර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාලව අවස්ථා 34 ක් යටතේ රු.16,200 ක බලපත්‍ර ගාස්තු ආදායමක් ලැබී තිබුණි. ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර බලපත්‍ර ලබාගත යුතු ස්ථාන හඳුනා ගැනීමක් සිදුව නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟයක් අනාවරණය නොවන අතර ඒ හේතුවෙන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150(1) පරිදි හිඟ මුදල් අයකිරීමේ ක්‍රියාවලියක් ද සිදුකර නොතිබුණි.

එමෙන්ම ව්‍යාපාර බදු අයකල හැකි ස්ථාන වෙනමම හඳුනාගෙන ඒ අනුව බදු අයකිරීමක් ද සිදුව නොතිබුණි.

2.4 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 අයවැයගත | 2010 තථ්‍ය | 2010 විචලනය | 2009 අයවැයගත | 2009 තථ්‍ය | 2009 විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 17,954 | 17,473 | 481 | 18,203 | 16,720 | 1,483 |
| අනෙකුත් | 11,217 | 14,002 | (2,785) | 9,174 | 13,087 | (3,913) |
| උප එකතුව | 29,171 | 31,475 | (2,304) | 27,377 | 29,807 | (2,430) |
| ප්‍රාග්ධන වියදම | 10,175 | 6,507 | 3,668 | 26,626 | 8,138 | 18,488 |
| මුළු එකතුව | 39,346 | 37,982 | 1,364 | 54,003 | 37,945 | 16,058 |

2.5 මානව සම්පත් කළමණාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 02 | 02 |
| ද්විතීයික | 26 | 22 |
| ප්‍රාථමික | 44 | 36 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 18 |

2.6 වත්කම් කළමණාකරණය

2.6.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම, ආදායම් ණයගැතියෝ රු.4,977,220 ක් හා පෙර ගෙවුම් රු.51,717 ක් ලෙස රු.5,028,937 ක් වූ අතර, ඒ පිළිබඳ කාල විශ්ලේෂණ ඉදිරිපත් නොවුණි.

2.6.2 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම හිඟහිට තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.26,667 ක් විය.

2.6.3 <u>අචල ජංගම වත්කම්</u>

ලංකා බැංකු ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට රු.34,464 ක් වූ අක්‍රීය ජංගම මුදල් ගිණුම් ශේෂයක් පැවතුණි.

2.7 <u>කාර්ය සාධනය</u>

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ). වාර්ෂික ඇස්තමේන්තු අනුව රු.7,625,000 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ව්‍යාපෘති 43 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර පැවතියද අරමුදල් ලබාගැනීමේ අපහසුතාවය මත ඒ යටතේ ක්‍රියාත්මක කර තිබුනේ ඇස්තමේන්තුගත පිරිවැය රු.3,320,000 ක් වූ ව්‍යාපෘති 17 ක් පමණ.

(ආ). අරමුදල් ප්‍රභවය සහා අරමුදල් ලෙස යොදාගෙන රු.450,000 ක් වටිනා ව්‍යාපෘති 5 ක් ඉටුකිරීමට කටයුතු සැලසුම් කර තිබුණද, සහා ප්‍රතිපාදන හිඟවීම මත එකී ව්‍යාපෘති ඉටුකර නොතිබුණි.

2.8 <u>අභ්‍යන්තර විගණනය</u>

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

03. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) මුල්‍ය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඊ) වත්කම් කළමනාකරණය